# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2468/25 - 2025 දෙසැම්බර් මස 26 වැනි සිකුරාදා - 2025.12.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සංගණන ආඥාපනත

සංගණන ආඥාපනතේ (143 අධිකාරයේ) 5 වැනි වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන, අමාත්‍යවරයා විසින් පනවන ලද ව්‍යවස්ථා.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2025 දෙසැම්බර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

ව්‍යවස්ථා

**I කොටස - ප්‍රාරම්භය**

3. මෙම ව්‍යවස්ථා ආර්ථික සංගණනය 2025/26 (කෘෂිකාර්මික කටයුතු) ව්‍යවස්ථා යනුවෙන් දක්වනු ලැබේ.

4. මෙම ව්‍යවස්ථා සම්බන්ධයෙන් අන්‍ය අර්ථකථනයක් අවශ්‍ය වුවහොත් විනා ‘ආඥාපනත’ සංගණන ආඥාපනත (143 අධිකාරය) ද, **‘අධිකාරි’** යනුවෙන් සංගණන අධිකාරිවරයා ද, ‘කොමසාරිස්’ යනුවෙන් සංගණන කොමසාරිස්වරයා ද, ‘නියෝජ්‍ය කොමසාරිස්’ යනුවෙන් නියෝජ්‍ය සංගණන කොමසාරිස්වරයා ද ‘සහකාර කොමසාරිස්’ යනුවෙන් සහකාර සංගණන කොමසාරිස්වරයා ද (සංගණන අධිකාරි හා සංගණන කොමසාරිස්වරුන්, 2025 අගෝස්තු මස 07 වැනි දින, අංක 2448/38 දරන *අති විශෙෂ ගැසට් නිවේදනය* මඟින් ප්‍රකාශයට පත් කර ඇත). ඊට අමතර වශයෙන් තොරතුරු රැස්කිරීමේ කටයුතු සඳහා සම්බන්ධ වන නිලධාරීන් ‘සංගණන නිලධාරී’ ලෙස ද අදහස් කෙරේ.

*II කොටස - සාමාන්‍ය*

4. ආර්ථික සංගණනය 2025/26 හි කෘෂිකාර්මික තොරතුරු රැස්කිරීමේ කටයුතු පහත සඳහන් පරිදි පැවැත්විය යුතු වේ.

| ක්‍රියාවලිය | කාල වකවානුව |
|---|---|
| (ii) ටැබ්ලට් පරිගණක මගින් හෝ ඇන්ඩ්‍රොයිඩ් (Android) ජංගම දුරකථන උපාංග භාවිතයෙන් කෘෂිකාර්මික කටයුතු පිළිබඳ තොරතුරු රැස් කිරීම. | 2025 හතරවන කාර්තුව හා 2026 පළමුවන කාර්තුව තුළ |

5. සෑම පුද්ගලයෙකුම, තම නිවාස ඒකකයට/ආයතනයට අදාළ කෘෂිකාර්මික තොරතුරු, ඒ සඳහා අධිකාරි හෝ කොමසාරිස් විසින් අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසයට පත් කරනු ලබන නිලධාරියාට සැපයිය යුතුය.

6. සංගණන අධිකාරි හෝ කොමසාරිස් විසින් පත් කරනු ලබන අධීක්ෂණ නිලධාරීන් විසින්, තොරතුරු රැස්කිරීමට අදාළ උපාංගයට ඇතුළත් කරන ලද තොරතුරුවල නිවැරදිතාවය/තත්ත්වය පිළිබඳව පරීක්ෂා කළ යුතුය.

*III කොටස - තොරතුරු රැස්කරන නිලධාරීන්ගේ රාජකාරි කටයුතු*

8. සංගණන ආඥාපනතින් හෝ ඒ යටතේ පනවන ලද යම්කිසි ව්‍යවස්ථාවකින් සංගණන අධිකාරි වෙත පවරන ලද හෝ ප්‍රදානය කරන ලද ඕනෑම බලයක් හෝ රාජකාරියක් අධිකාරී පොදු හෝ විශේෂ විධානය පරිදි, නියෝජ්‍ය සංගණන අධිකාරිවරයෙක් විසින් දිවයින තුළ ද, ප්‍රදේශය භාර නියෝජ්‍ය/සහකාර සංගණන අධිකාරිවරයෙක් විසින් එම නියෝජ්‍ය/ සහකාර සංගණන අධිකාරිවරයාට නියමිත ප්‍රදේශය තුළ ද ක්‍රියාවේ යෙදවීම හෝ ඉටු කිරීම කළ හැකිය.

9. සංගණන ආඥාපනතින් හෝ ඒ යටතේ පනවන ලද යම්කිසි ව්‍යවස්ථාවකින් කොමසාරිස්වරයෙකු වෙත පවරන ලද හෝ ප්‍රදානය කරන ලද ඕනෑම බලයක් හෝ රාජකාරියක් එම ප්‍රදේශයේ කොමසාරිස්වරයාගේ පොදු හෝ විශේෂ විධානය පරිදි, තමා පත් වී සිටින ප්‍රදේශ සීමාව තුළ ක්‍රියාවෙහි යෙදවීම හෝ ඉටු කිරීම නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරයෙකු විසින් කළ හැකිය.

10. සෑම ගණන් ගන්නා නිලධාරියෙක්ම, අධිකාරි හෝ තමා ගණන් ගන්නා නිලධාරියෙකු වශයෙන් පත් වී ඇති ප්‍රදේශය භාර සංගණන කොමසාරිස් හෝ නියෝජ්‍ය / සහකාර කොමසාරිස් විසින් නියම කරන ලද දිනවල දී. නියම කරන ලද ස්ථානවල දී හා වේලාවන් හි දී පුහුණු පන්තිවලට සහභාගී විය යුතුය.

11. තොරතුරු රැස්කිරීමේ කාර්යය සඳහා යොදවන ලද ගණන් ගන්නා නිලධාරියෙකු විසින් සාමාන්‍යයෙන් එම සේවය සම්බන්ධයෙන් හැරුණු විට, උපලේඛනය සම්පූර්ණ කිරීම සඳහා තමන් විසින් ලබා ගන්නා ලද කිසියම් තොරතුරක් නීත්‍යානුකූල බලයක් නොමැතිව ප්‍රසිද්ධ කිරීම හෝ අන් කිසිවෙකුට දැනුම් දීම හෝ නොකළ යුතුය.

12. තොරතුරු රැස්කිරීමේ කාර්යය සඳහා යොදවන ලද ගණන් ගන්නා නිලධාරියෙකු විසින් ගණන් ගැනීමට අදාළ ටැබ්ලට් පරිගණක උපාංගය හෝ ආකෘතිපත්‍ර හෝ වෙනත් ලියකියවිලි තුළ ඇති තොරතුරු, තමන්ගේ භාරයේ තිබෙන තෙක් නීත්‍යානුකූල බලයක් නොමැති කිසිවෙකුට ඒවා නොපෙන්විය යුතුය.

13. තොරතුරු රැස්කිරීමේ කාර්යයක් සඳහා යොදවන ලද ගණන් ගන්නා නිලධාරියෙකු විසින් තමා සේවයට පත් වූ අවස්ථාවේ දී පහත දැක්වෙන දිවුරුම හෙවත් සහතික ප්‍රකාශය සම්පූර්ණ කොට අත්සන් කළ යුතුය.

.................................................................................................................................................................. වන මම ........................................................................................................... (සංගණන තනතුර) වශයෙන් මාගේ යුතුකම් සංගණන ආඥාපනතේ නියමයන්ට හා ඒ යටතේ පනවා ඇති නීති වලට එකඟව, විශ්වාසවන්තව හා අවංකව ඉෂ්ඨ කරන බවත්, එමෙන්ම සංගණන නිලධාරියෙකු වශයෙන් සේවය කිරීමේ දී මට ලබා ගත හැකි වන කවර නමුත් තොරතුරක් ඒ සඳහා නියමිත බලයක් නොලැබ ප්‍රසිද්ධ කිරීම හෝ එළිදරව් කිරීම නොකරන බවත්, විධිමත්ව, අවංකව හා සැබෑ වශයෙන් ද සහතික කොට/ දිවුරා * මෙයින් ප්‍රකාශ කරමි.

..............................
අත්සන

මා ඉදිරිපිට දී ය.

ස්ථානය : ...........................................
දිනය : ...........................................

............................................................
නියෝජ්‍ය / සහකාර සංගණන කොමසාරිස්

14. අධීක්ෂණ නිලධාරියෙකුගේ ධූරයට පහත් නොවූ, ධූරයක් දරන සැම සංගණන නිලධාරියෙකුටම පූර්වෝක්ත ව්‍යවස්ථාව යටතේ සඳහන් දිවුරුම හෝ සහතික ප්‍රකාශය අන් සංගණන නිලධාරියෙකුගෙන් ලබා ගැනීමට හැකිය.

IV කොටස - කෘෂිකාර්මික කටයුතු ගණන් ගැනීම සඳහා ලබා ගත යුතු තොරතුරු

5. ආර්ථික සංගණනය (කෘෂිකාර්මික කටයුතු) ගණන් ගැනීමේ ප්‍රශ්නාවලිය මගින් ලබා ගන්නා තොරතුරු පහත සඳහන් වේ.

අ) කෘෂිකාර්මික කටයුතු හඳුනා ගැනීම සම්බන්ධ පහත සඳහන් තොරතුරු

x. ඒකකය විසින් 2024/25 වගා වර්ෂය තුළ නිරත වූ කෘෂිකාර්මික කටයුතු පිළිබඳ තොරතුරු:
2024/25 වගා වර්ෂය තුළ සිදු කළ බෝග වගාව, 2025.09.30 දිනට සත්ත්ව පාලනය සහ 2024/25 වගා වර්ෂය තුළ බිම් කැබැල්ල තුළ සිදු කරන ලද ජල ජීවී වගාව.

xi. කෘෂිකාර්මික කටයුතු සිදු කරන ඒකකවල ප්‍රධාන ගොවිකාරකයාගේ සහ ගොවි කාණ්ඩයේ තොරතුරු :

o. ස්ත්‍රී පුරුෂ භාවය ....................................

p. උපන් දිනය .......................................

q. වයස් කාණ්ඩ ........................................

r. විවාහක තත්ත්වය ........................................

s. අධ්‍යාපන සුදුසුකම් ........................................

t. කෘෂිකර්මාන්තයට අදාළව වෘත්තීය පුහුණුවක් ලබා තිබේද යන්න ........................................

u. ප්‍රධාන ආදායම් මාර්ගයේ ස්වභාවය ........................................

v. වෙනත් ආදායම් මාර්ග පිළිබඳ තොරතුරු ........................................

w. නිරත වූ වෙනත් ආර්ථික ක්‍රියාකාරකම් ........................................

x. අන්තර්ජාලයෙන් කෘෂිකාර්මික දැනුම ලබා ගැනීමේ හැකියාව .......................................

y, කෘෂිකාර්මික කටයුතුවල නිරත වූ සාමාන්‍ය පැය ගණන .......................................

z. ගොවි කාණ්ඩය සඳහා කුළියට /වැටුපට ගත් කළමනාකරුවන් පිළිබඳ තොරතුරු .......................................

aa. ගොවි කාණ්ඩය වෙනුවෙන් යොදවාගත් සේවක සංඛ්‍යාව සහ සේවය කළ දින ගණන .......................................
bb. සහශ්‍ර සංවර්ධන දර්ශක (SDG Indicators) ගණනය කිරීම සඳහා සෑම ඒකකයකින්ම අහඹු ලෙස තෝරාගත් එක් පුද්ගලයකුගෙන් පහත තොරතුරු ලබාගනී.

- නම ..........................................
- ස්ත්‍රී පුරුෂ භාවය ........................
- වයස ........................................
- කෘෂිකාර්මික කටයුතු සිදු කිරීමට බිම් කැබැල්ලක් තිබේද යන බව .......................
- ඉඩමේ අයිතිය තහවුරු කිරීමට ලේඛනයක් තිබේද යන බව ................................
- එම ලේඛනයේ ඔහුගේ/ ඇයගේ නම සඳහන්ව තිබේ ද යන බව ............................
- කෘෂිකාර්මික ඉඩම්වලට ඇති අයිතිය පිළිබඳ තොරතුරු .....................................

xii. ඒකකය සතු බිම් කැබලි සහ ඒවායේ භාවිතයන්:

i. ගොවි කාණ්ඩය සතු මුළු බිම් කැබලි සංඛ්‍යාව .....................................
j. බිම් කැබැලිවල නම් .....................................
k. බිම් කැබැලිවල පිහිටීම .....................................
l. බිම් කැබැලිවල බුක්තිය .....................................
m. කැබලිවල මුළු බිම් ප්‍රමාණය .......................................
n. බිම් කැබලිවල භාවිතය සහ එම භාවිතය යටතේ ඇති බිම් ප්‍රමාණය

- වී හැර අනෙකුත් කාලීන බෝග වගා කර ඇති බිම් ප්‍රමාණය ......................................
- ස්ථිර / අර්ධ ස්ථිර බෝග වගා කර ඇති බිම් ප්‍රමාණය ......................................
- ආර්ථික වන වගා සහිත බිම ප්‍රමාණය .....................................
- සත්ත්ව පාලනය සිදු කරන බිම් ප්‍රමාණය ......................................
- ජල ජීවී වගාව සඳහා ඉදි කරන ලද පොකුණු හා ජලාශ වලට යට වූ බිම් ප්‍රමාණය .....................................
- තාවකාලිකව වගා කටයුතු සිදු නොකර ඇති බිම් ප්‍රමාණය .....................................
- කැලෑ/ ලඳු කැලෑ /තෘණ බිම්වලට යටවූ බිම් ප්‍රමාණය .....................................
- නිෂ්ප්‍රයෝජනවත් බිම් (ගල් තලා / මඩ වගුරු) බිම ප්‍රමාණය .....................................
- ගොඩනැගිලි/පාරවල් ආදියට යට වූ බිම් ප්‍රමාණය .....................................
- අන්තැනක සඳහන් නොකළ බිම් ප්‍රමාණය .....................................

o. ඒකකයෙහි ගෙවතු වගාවක් ලෙස කිසියම් ආහාර බෝගයක් හෝ සත්ත්ව පාලන කටයුත්තක් සිදු කරන්නේ ද යන්න ... ...........................................................................................

p. 2025 සැප්තැම්බර් 30 දින වන විට මෙම ගොවි කාණ්ඩයට අයත් කිසියම් බිම් කැබැල්ලක් වෙනත් පාර්ශ්වයක් සඳහා කුලියට/ බද්දට ලබා දී තිබේ ද යන්න .......................................

- 2025 සැප්තැම්බර් 30 දින වන විට මෙම ගොවි කාණ්ඩයට අයත් නමුත් වෙනත් පාර්ශ්වයක් සඳහා කුලියට / බද්දට ලබා දී ඇති මුළු බිම් ප්‍රමාණය ..............................................

xiii. වී හා අනෙකුත් කාලීන බෝග පිළිබඳ තොරතුරු:

h. බෝග වගා කළ වගා කන්නය ............................
i. ගොවි කාණ්ඩය තුළ කාලීන බෝග වගාව සඳහා නවීන තාක්ෂණය භාවිතා කරන්නේ ද යන්න සහ භාවිතා කළ නවීන තාක්ෂණ ක්‍රමවේදය ............................

j. භාවිතා කළ වාරි ක්‍රමය ............................
k. ගොවි කාණ්ඩය තුළ පොහොර භාවිතය ............................
l. වගා වර්ෂය තුළ හරිතාගාරයක් තුළ වගා කර ඇත්නම්, වගා කළ භූමි ප්‍රමාණය කොපමණ ද යන්න ............................
m. වගා කළ බෝග වර්ග ............................
n. එම බෝග වගා කරන ලද බිම් ප්‍රමාණයන් ............................

xiv. ස්ථිර හෝ අර්ධ ස්ථිර බෝග පිළිබඳ විස්තර:

h. වගාකල බෝග වර්ග ......................................
i. බෝග වගා කර ඇත්තේ ක්‍රමවත්වද / විසිරි වගාවක් ලෙස ද යන්න ......................................
j. ක්‍රමවත්ව වගාකර ඇති මුළු බිම් ප්‍රමාණය ......................................
k. ක්‍රමවත් වගාවේ ඵල දරන බිම් ප්‍රමාණය ......................................
l. විසිරි වගාව යටතේ ඇති මුළු ගස් ප්‍රමාණය ......................................
m. ඩිසිරි වගාව යටතේ ඇති ඵල දරන ගස් ප්‍රමාණය ......................................
n. පොහොර / දිලීරනාශක / කෘමිනාශක වල්නාශක භාවිතය ......................................

xv. 2025 සැප්තැම්බර් 30 දිනට සත්ත්ව පාලනය පිළිබඳ තොරතුරු:

d. සත්ත්ව කාණ්ඩය ......................................
e. එම කාණ්ඩ අනුව සතුන් ගණන ......................................
f. අභිජනනය සඳහා වන ගැහැණු සතුන් ගණන ......................................

xvi. ජලජීවී වගාව පිළිබඳ තොරතුරු:

e. වගා කරන ජලජීවී වර්ගය ......................................
f. ජල ජීවී වගාව සඳහා යොදාගත් ජලයේ ස්වභාවය ......................................
g. ජල ජීවී වගා ක්‍රමය ......................................
h. යෙදී සිටින ජල ජීවී වගා කටයුත්ත ......................................

xvii. ඒකකය භාවිතා කරන ලද/ ඒකකය සතු කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ පිළිබඳ තොරතුරු:

d. භාවිතා කරන ලද කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ මොනවාද යන්න ......................................
e. භාවිතා කළ කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණවල අයිතියේ ස්වභාවය ......................................
f. අයිතිය ගොවි කාණ්ඩය සතු කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ සංඛ්‍යාව ......................................

xviii. ආයතනවල ස්ථිර සේවකයන් පිළිබඳ තොරතුරු:

b. ස්ත්‍රී / පුරුෂ භාවය අනුව රැකියා වර්ග 10 යටතේ සේවක සංඛ්‍යාව......................................

6. ගණන් ගන්නා නිලධාරියෙකුට තමාගේ ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ තිබෙන නිවාස ඒකක/ ආයතන වෙත ගොස් මෙම කොටසේ I වන ව්‍යවස්ථාව යටතේ දැක්වෙන කරුණු වලට අදාළ ප්‍රශ්න විචාරීමෙන් සංගණන කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගත හැක.

7. අධිකාරී සුදුසු යැයි නියම කරන ඕනෑම අවස්ථාවක පුද්ගලයින්ගේ කෘෂිකාර්මික කටයුතු පිළිබඳව ලබා ගන්නා ලද තොරතුරු ඕනෑම පුද්ගලයෙකුගෙන් නැවත විමසා දැන ගැනීමට සංගණන නිලධාරියෙකුට පිළිවන.

8. මෙම කොටසේ 1 වැනි ව්‍යවස්ථාව යටතේ දැක්වෙන කරුණු කිසියම් පුද්ගලයෙකු වෙනුවෙන් සංගණනයේ දී වාර්තාගත වී තිබේ දැයි සැහීමකට පත්වනු පිණිස, මෙම කොටසේ I වැනි ව්‍යවස්ථාව යටතේ දැක්වෙන කරුණු සියල්ලම හෝ කිහිපයක් වාර්තාගත කිරීම පිණිස අවශ්‍ය ඔහුගේ සහ පවුලේ සාමාජිකයින්ගේ කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ප්‍රශ්ණ ඇසීමට සංගණන නිලධාරියෙකුට හැකි වන අතර එම ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම එකී පුද්ගලයාගේ යුතුකම වන්නේය.

EOG 12 - 0229

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.